# පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
## மாகாண சமூக சேவைகள் திணைக்களம் - வடமத்திய மாகாணம்
## PROVINCIAL DEPARTMENT OF SOCIAL SERVICES – NORTH CENTRAL PROVINCE

372, ධර්මපාල මාවත, අනුරාධපුර. இல 372,தர்மபால மாவத்தை, அநுராதபுரம் NO. 372, Dharmapala Mawatha, Anuradhapura

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director | 025 - 2234673 | කාර්යාලය / அலுவலகம் / Office | 025 - 2224173 | ෆැක්ස් / பெக்ஸ / Fax | 025 - 2224173 |
| මගේ අංකය / எனது இலக்கம் / My No. | NCP/SS/E1/20 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2015/11/ |


පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ - 10/2015

උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ
සියළුම සංවර්ධන සහකාර නිලධාරීන්/ සංවර්ධන නිලධාරීන් වෙත,

තැලසීමියා රෝගීන් සඳහා ලබා දෙන මාසික ආධාර මුදල සංශෝධනය

රෝගී තත්වය නිසා ආර්ථිකමය දුෂ්කරතාවයන්ට පත්වීම හේතුවෙන් රෝගියාගේ ශරීර සෞඛ්‍යය හා පෝෂණ තත්වය පිරිහීමට පත්වීම වලක්වා ගැනීමත්, රෝගියාගෙන් යැපෙන්නන් පෝෂණය කර ගැනීමට නොහැකි තත්වයන්ට පත්වූවන් සඳහා සහනයක් සැළසීමත්, අඛණ්ඩව ප්‍රතිකාර ගැනීම සඳහා රෝගියා පෙළඹවීමත් අරමුණින් අඩුආදායම්ලාභී තැලසීමියා රෝගීන් සඳහා මෙම දෙපාර්තමේන්තුව මගින් මාසිකව ලබා දෙනු ලබන රු.1,000.00 රෝගාධාර මුදල රු. 3,000.00ක් දක්වා වැඩි කිරීමට තීරණය කර ඇත..

02. තැලසීමියා රෝගීන් සම්බන්ධයෙන් රජයේ රෝහලක තැලසීමියා ඒකකයේ ඒකක භාර වෛද්‍ය නිලධාරී විසින් නියමිත ආකෘතියේ හෝ ඊට අදාල විධිමත් ආකෘතියකින් නිකුත් කෙරෙන වෛද්‍ය සහතිකයක් මත මෙම ආධාර මුදල් ගෙවීම සිදු කළ යුතුය. ආධාර ගෙවීම ආරම්භ කළ දින සිට වසරකට වතාවක් මෙම ආධාර ලාභීන් සම්බන්ධයෙන් නැවත සමීක්ෂණයක් කොට ආධාර මුදල් තවදුරටත් ගෙවීම සම්බන්ධයෙන් වෛද්‍ය නිර්දේශය ගෙන්වා ගැනීමටත් ඒ අනුව අවශ්‍ය නම් ආධාර මුදල් ගෙවීම තවදුරටත් දීර්ඝ කිරීමටත් කටයුතු කළ යුතුය.

03. ඒ අනුව 2015 නොවැම්බර් සිට මාසික තැලසීමියා රෝග ආධාර මුදල රු. 3,000.00ක් ලෙස වැඩිකර ගෙවීම ක්‍රියාත්මක වනු ඇත.

04. උතුරු මැද පළාත් සභාවේ 2015/21 දරණ අමාත්‍ය මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කරන ලද අංක 2015/92 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

අජන්ත ගුණවර්ධන,
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ,
උතුරු මැද පළාත.

අජන්ත ගුණවර්ධන
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ
උතුරු මැද පළාත